# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 34 දරන
# ඉෂා-අතුල් ඉස්ලාම් අනාථ නිවාසය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 අගෝස්තු මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1984 අගෝස්තු මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි    තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 34 දරන ඉෂා-අතුල් ඉස්ලාම් අනාථ නිවාසය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 අගෝස්තු මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 43/83.

**ඉෂා-අතුල් ඉස්ලාම් අනාථ නිවාසය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

*පූර්විකාව.*

පිරිමි මුස්ලිම් අනාථයින්, විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ එවැනි අනාථයින් පෝෂණය කිරීමේ කාර්ය සඳහා ඉෂා-අතුල් ඉස්ලාම් සංවිධානය විසින් "ඉෂා-අතුල් ඉස්ලාම් අනාථ නිවාසය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සංවිධානය කරනු ලබන ආයතනයක් මෙතෙක් කල් කළුතර ධර්ගා නගරයෙහි පවත්වා ගෙන ගොස් ඇති හෙයින් ද :

එකී ඉෂා-අතුල් ඉස්ලාම් සංවිධානයේ විධායක කමිටුව විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකී අනාථ නිවාසයේ කටයුතු සහ පරමාර්ථ මෙතෙක් කල් සාර්ථකව ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් ද :

එකී අනාථ නිවාසය සංස්ථාගත කරනු ලැබීමට එකී අනාථ නිවාසයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලුම් කර ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 1984 අංක 34 දරන ඉෂා-අතුල් ඉස්ලාම් අනාථ නිවාසය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ඉෂා-අතුල් ඉස්ලාම් අනාථ නිවාසය සංස්ථාගත කිරීම.*

**2.** (මෙහි මින් මතු "අනාථ නිවාසය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉෂා-අතුල් ඉස්ලාම් අනාථ නිවාසයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනට නිල දරන තැනැත්තන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයින් මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ඉෂා-අතුල් ඉස්ලාම් අනාථ නිවාසය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර එසේ සංස්ථාවක් බවට පත්වන්නේය. තවද ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද ඒ සංස්ථා නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමටද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමටද සම්පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

**3.** සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අසරණ පිරිමි මුස්ලිම් අනාථයින්, විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ එවැනි අනාථයින් පෝෂණය කිරීම ;

(ආ) ඔවුන්ගේ අධ්‍යාපනික හා ආගමික සංවර්ධනය සඳහා පහසුකම් ඔවුන්ට සැපයීම ;

(ඇ) වෘත්තීය පුහුණුවක් සඳහා ඔවුන්ට අවස්ථා සලසාදීම ; සහ

(ඈ) ඔවුන්ගේ සමත්කම්වලට අනුව උසස් අධ්‍යාපනය හෝ රැකියා හෝ ලබා ගැනීමට ඔවුන්ට මාර්ගෝපදේශකත්වය සහ ආධාර කිරීම.

ඒ—71298-6,225 (83/07)

අධ්‍යක්ෂ මණ්ඩලය.

4. (1) සංස්ථාවේ සාමාන්‍ය පරිපාලනය සහ මෙහෙයවීම පහත සඳහන් පරිදි වූ සාමාජිකයන් විසිදෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පැවරේ.

(අ) ඉෂා-අතුල් ඉස්ලාම් සංවිධානයේ විධායක කමිටුව විසින් පත් කරනු ලබන සාමාජිකයන් දහඅටදෙනෙක් ; සහ

(ආ) ඉෂා-අතුල් ඉස්ලාම් සංවිධානයේ පිළිවෙළින් තත් කාලයේ ලේකම් ධුරය සහ භාණ්ඩාගාරික ධුරය දරන තැනැත්තන් වන සාමාජිකයන් දෙදෙනෙක්.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන්, සාමාජිකයන් අතුරෙන් යම් සාමාජිකයකුගේ—

(අ) මරණය ;

(ආ) ඉල්ලා අස්වීම ; හෝ

(ඇ) ඉෂා-අතුල් ඉස්ලාම් සංවිධානයේ විධායක කමිටුව විසින් ධුර යෙන් ඉවත් කරනු ලැබීම

හේතු කොටගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් ඇති වූ විටක දී ඒ පුරප්පාඩුව, ඉෂා- අතුල් ඉස්ලාම් සංවිධානයේ විධායක කමිටුව විසින් පුරවනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් ඇති වී තිබීමේ හේතුව නිසාම පමණක් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කර්තව්‍යයක් අවලංගු වන්නේ යයි නොසැලකිය යුතුය.

(4) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේ ධුර දැරූ අනාථ නිවාසයේ අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය විය යුතු ය. තවද, මේ පනත ක්‍රියාත්මක වූ දින පටන් අවුරුදු තුනක් ගතවන තුරු ඒ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දිගටම කටයුතු කරනු ලැබිය යුතු ය. ඉන්පසු, සෑම අනුප්‍රාප්තික අධ්‍යක්ෂ මණ්ඩලයකම ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක කමිටුව.

5. (1) සංස්ථාවේ එදිනෙදා කටයුතු, සංස්ථාවේ රීතිවලට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට යටත්ව, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක කමිටුවක් විසින් පරිපාලනය කළ යුතු ය :—

(අ) සංස්ථාවේ රීතිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී තෝරා පත් කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, කළමනාකරු සහ තවත් සාමාජික යන් දෙදෙනෙක් ; සහ

(ආ) ඉෂා-අතුල් ඉස්ලාම් සංවිධානයේ පිළිවෙළින් තත් කාලයේ ලේකම් ධුරය සහ භාණ්ඩාගාරික ධුරය දරන තැනැත්තන්.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේ ධුර දරන අනාථ නිවාසයේ විධායක කමිටුව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය. තව ද, මේ පනත ක්‍රියාත්මක වූ දින පටන් අවුරුදු තුනක් ගතවන තුරු ඒ විධායක කමිටුව විසින් දිගටම කටයුතු කරනු ලැබිය යුතු ය. ඉන් පසුව, සෑම අනුප්‍රාප්තික විධායක කමිටුවකම ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය බලතල.

6. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ නාමින් පහත සඳහන් දෑ කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට ඇත්තේ ය :—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් අරමුදල් රැස්කිරීම සඳහා ආයාචනා කිරීම සහ ආධාර මුදල්, ත්‍යාග හෝ පරිත්‍යාග, මුදලින් නැතහොත් ද්‍රව්‍යවලින් ලබා ගැනීම ;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර ආකාරයකින් වුව ද අත්පත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ වෙනත් ආකාරයකින් නියෝදනය කිරීම ;

(ඇ) ස්වකීය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම ;

(ඈ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම සහ ඇප ඇතුව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ රැස් කිරීම ; සහ

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ආනුෂංගික වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේවල් සිදු කිරීම.

සංස්ථාවේ රීති.

7. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල එහි සාමාජිකයන්ගේ මහ සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ රීති සෑදීමෙන් පසු, එවැනි ම රැස්වීමක දී ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

අනාථ නිවාසයෙන් ගෙවිය යුතු සහ අනාථ නිවාසයට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙහි දී පවතින අනාථ නිවාසයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර අනාථ නිවාසයට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සහභාග මුදල් සංස්ථාවට ගෙවිය යුතුය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**9.** සභාපති හෝ ලේකම් හෝ භාණ්ඩාගාරික සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තවත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. ඔවුන් ඉදිරිපිට දී මුද්‍රාව තැබූ බවට ලකුණක් වශයෙන් ඔවුන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර ඒ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.